# ශාමා සහ පුංචි ටොෆී



Y. G. සෙනුකි දිහන්සා

# ශාමා සහ පුංචි ටොෂී

**කතෘ -:** Y. G. සෙනුකි දිහන්සා

**චිත්‍ර -:** Y. G. සෙනුකි දිහන්සා

**ISBN -:** 978-624-208-502-9

**දිනය -:** 2025.02.08



# පිදුම

මහනුවර මහමායා බාලිකා විදුහලේ
විදුහල්පතිනිය වන ශශිකලා සේනාධීර
මහත්මියටත්,

ප්‍රාථමික අංශය භාර සහකාර
විදුහල්පතිනිය වන සුසිතා අල්විස්
මහත්මියටත්,

මට අකුරු කියා දෙන ප්‍රමිතා වෙත්තසිංහ
ගුරුමෑණියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්, මෙම පොත හදපිරි
බැතියෙන් පිළිගන්වමි.



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන ”හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවදියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහමායා බාලිකා විද්‍යාලය මහනුවර

එක ගමක හිටියා පුංචි බලු පැටියෙක්. එයාගේ නම ටොෂී. එයාව බලා ගත්තේ ශාමා කියලා පුංචි බබෙක්. මේ දෙන්නා හරිම සතුටින් ජීවත් වුණා.





දවසක් ශාමා උදේ නැගිටලා බලද්දි ටොෂී හිටියේ නෑ. ශාමා හැමතැනම හෙව්වා. ඒත් හිටියේ නෑ. ටොෂීව කවුරු හරි අරන් ගිහින් කියලා ශාමා හොඳටම ඇඬුවා.

එදා ශාමා අම්මා සමග පොළට යන කොට දැක්කා එයාගේ බලු පැටියා පාර අයිනේ ඉන්නවා.





ශාමා දුවගෙන ගිහින්
බලු පැටියව අතට ගත්තා. ශාමත්
ටොෂීත් සතුටු වුණා. අම්මා සහ ශාමා
බලු පැටියා අරන් ගෙදර ගියා.

ශාමාගේ හොඳම යාළුවා රෝසිත් එයාලගේ ගෙදර ආවා. මේ දෙන්නම බලු පැටියා එක්ක සතුටින් සෙල්ලම් කළා.





රෝසි ගෙදර ගිහින් එයාටත් බලු පැටියෙක් ඕනේ කියලා ඇඬුවා. රෝසිගේ අම්මා එයාටත් බලු පැටියෙක් ගෙනත් දුන්නා.


රෝසි ගොඩක් සතුටින් උඩ පැන්නා. එයා අම්මට ස්තූති කළා.





රෝසි ශාමාට එයාගේ බලු පැටියා බලන්න එන්න කිව්වා. ශාමා එයාගේ බලු පැටියා එක්ක රෝසිගේ ගෙදර ගියා.

ශාමාත් රෝසිත් බලු පැටව් දෙන්නා සමග සතුටින් සෙල්ලම් කළා.



සෙල්ලම් කරලා ඉවර වෙලා ශාමා ටොෂීව පරිස්සමෙන් ගෙදර එක්කන් ගියා.



ශාමා එදායින් පස්සේ ටොෂීව හොඳින් රැකබලා ගත්තා. ඉතින් පුංචි අපිත් සතුන්ව ආදරයෙන් රැක බලා ගනිමු.



# ස්තූතියි !

මෙම පොත සෑදීමට උදව් උපකාර කල
සියලු දෙනාටම මාගේ හෘදයාංගම ස්තූතිය
පුද කර සිටිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වල සාහිත්‍යය ප්‍රබෝධමත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔබි නැංවීම සහ ඒ දැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව දෙදා 2017 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කාලප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද සම්බන්ධ ජරා ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමාය බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මේවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනාර්ථකාරි මෙන්ම සමාජය තුල විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.

මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්



නම-: Y. G. සෙනුකි දිහන්සා

**ISBN -:** 978-624-208-502-9